කැස්බෑව නගර සභාව - 2022

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කැස්බෑව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.**

(ආ) **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 නොසැසඳුම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂය ඒවාට අදාළ උපලේඛනය සමඟ සැසඳීමේදී රු.405,131 ක වෙනසක් විය. | 2022 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදිව කළ යුතුවේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාල විශ්ලේෂණය හා අනෙකුත් තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.281,047 ක් වූ විනෝද බදු ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙය අය කර ගැනීමට ක්‍රමවේදයක් නොමැති බැවින් ලේඛන ගැලපීම සඳහා ඉදිරි අනුමැතියට යොමු කර ඇති බව. | වටිනාකම තහවුරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පරීක්ෂා කර ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | ------------ |
| මු.රෙ.177 (1) | එකතු කරනු ලබන හිඟ වරිපනම් බදු මුදල් අත රඳවාගෙන සිට කාල ප්‍රමාදයන් සහිතව තැන්පත් කර තිබුණි. | මේ සම්බන්ධ ප්‍රමාදයන් පිළිබඳ හේතු විමසා ලිපි නිකුත් කර ඇති අතර ඔවුන් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කර ඇත. තවද මෙම කාල ප්‍රමාද සම්බන්ධව හිඟ ආදායම් එකතු කරන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිලධාරින් වෙත කාර්යාලිය නියෝගද නිකුත් කර ඇත. මේ සම්බන්ධව **2023.02.22** දිනැතිව විගණනය දැනුවත් කර ඇති බව. | |
| (ආ) | **2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (5)** | අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් අදාළ කාර්යය අවසන් කර දින **10** ක් තුළ අග්‍රිම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබූ අත්තිකාරම් මුදල් කාල ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි. | අවස්ථා **10** කට අදාළව ප්‍රමාදයන් සහිතව පියවී ඇත. මෙම බිල්පත් පියවීම් ප්‍රමාදයන් නිවැරදි කිරීමට අදාළව අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමටත් ඉදිරියේ දී මෙම ප්‍රමාදයන් සිදු නොවීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.**175,382,222** ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.**49,134,973** ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු) | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට මුළු හිඟය (රු) |
| වරිපනම් හා බ | 84,000,000 | 84,000,000 | 50,162,444 | 33,834,556 | 84,500,100 | 83,427,809 | 79,314,222 | 70,414,711 |
| කුලී | 15,500,000 | 12,656,200 | 13,699,622 | 1,239,839 | 21,076,000 | 12,763,479 | 13,770,532 | 2,937,390 |
| බලපත්‍ර ගාස්තු | 1,500,000 | 1,488,000 | 1,488,000 | - | 1,500,000 | 1,536,600 | 1,528,600 | - |
| වෙනත් ආදායම් | 290,000,000 | 315,000,000 | 315,000,000 | - | 225,000 | 191,250 | 191,250 | - |
| එකතුව | 391,000,000 | 413,144,200 | 380,350,066 | 35,074,395 | 107,301,100 | 97,919,138 | 94,804,604 | 73,352,101 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අය කර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.68,572,810 ක් වූ අතර රු.50,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 47 කින් අයවිය යුතු හිඟහිටි ශේෂය රු.5,152,197 ක් විය. | 2023.01.01 දිනට මුළු හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 53 ක මුදල රු.5,759,896.18 ක් වන අතර මේ වන විට ඉන් දේපළ 06 කට අදාළව රු.607,672.56 ක මුදලක් ගෙවා ඇති බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ආ)** | **කසළ බදු** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුළු කසළ බදු වටිනාකම රු.3,724,445 ක් වූ අතර කසළ බැහැර කිරීම් වෙනුවෙන් 2022 වර්ෂය වෙනුවෙන් කිසිදු මුදලක් නොගෙවූ ආයතන 10 කින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.1,185,955 ක් විය. | 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුළු කසළ බදු වටිනාකමින් මේ වන විට රු.1,528,705.50 ක මුදලක් අය වී ඇති අතර තවදුරටත් රු.3,724,445.50 ක් අය විය යුතුව ඇති බව. | හිඟ කසළ බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **කුලී** | | |
| **(i)** | සභාව සතුව දිගු කාලීනව බදුදෙන දේපළ 133 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.1,764,055 තුළ හිඟ වාරික 10 ට වැඩි දේපළ 16 කින් අයවිය යුතු මුදල රු.112,500 ක් විය. | රු.314,900 ක වටිනාකමෙන් 2023.03.31 දක්වා රු.202,400 ක් මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් ද අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ දේපළ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | සභාව සතු මාළු කඩ 20 කින් මාළු කඩ 07 ක් බදු දීමෙන් තොරව වසාදමා තිබුණි. | වසා දමා ඇති මාළු කඩ 07 සඳහා ටෙන්ඩර කළ ද කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවීම නිසා වෙනත් ආදායම් උත්පාදන අවස්ථාවකට යොදා ගැනීම සඳහා කටයුතු යොදා ඇති බව. | ආදායම් උපයා ගැනීමට සඳහා කටයුතු කළ යුතුවේ. |

(ඇ) විනෝද බදු

| | | |
|---|---|---|
| වසර **05** කට අධික කාලයක සිට පැවත එන රු.**281,047** ක විනෝද බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම විනෝද බදු මුදල කපා හැරීම සඳහා **2018.11.08** වන දින මහා සභා තීරණ අංක **(144) 6.4** අනුමැතිය ලැබී ඇති නමුත් විනෝද බදු හිඟ මුදල් අගය අත්හැරීම සඳහා මෙතෙක් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා දී නොමැති බැවින්, හිඟ ශේෂයක් ලෙස ගිණුම්වල ඉදිරියට ගෙනවිත් ඇති බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඉ) සම්ප්‍රේෂණ කුළුණු

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ සම්ප්‍රේෂණ කුළුණු **56** ක් හඳුනාගෙන ඇති අතර කුළුණු **08** ක් **2022** දෙසැම්බර් **31** දින වන විටත් තක්සේරු කිරීම් සිදු කර වර්පනම් අංක ලබා දී නොතිබුණි. | තක්සේරු නොවූ කුළුණු තක්සේරු කිරීම සඳහා අදාළ ආටතන වලට ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් එවන ලෙස දැනුම් දී ඇති අතර කුළුණු වලින් මේ වන විට අය විය යුතු මුදල් අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතින බව. | සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ **4** වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | | - |

(අ) කසළ කළමනාකරණය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මිශ්‍ර කසළ ටොන් **11394** ක් කරදියාන කසළ අංගනයට භාර දී තිබුණු අතර මුළු කසළ ප්‍රමාණයෙන් වෙන් නොකළ කසළ ප්‍රමාණය සියයට **69** ක් වී තිබුණි. | වෙන් කරන ලද කසළ ප්‍රමාණය වැඩිකර ගැනීමට තවදුරටත් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු හා ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයීය කසළ වෙන් කිරීමේ කටයුතු පුළුල් කිරීමටත් ගම් මට්ටමින් කසළ පොළ වැඩසටහන් සිදු කිරීමටත් කටයුතු යොදා ඇති බව. | කසළ නිසි පරිදි වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ආ) තිරසර සංවර්ධනය

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා **2019** සිට **2023** දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ආයතනික ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කර තිබුණ ද **2022** වර්ෂය සඳහා | **2023** වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ඇතුළත් කළ වාර්ෂික තිරසාර සංවර්ධන සැලැස්මක් ඉදිරි වර්ෂයේදී සකස් කරන බව. | දිගු කාලීන ඉලක්ක ලගා කර ගැනීම සඳහා වාර්ෂික සැලසුමක් සකස් කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සැලසුම් කළ ක්‍රියාකාරකම් වෙනුවෙන් අය වැය ප්‍රතිපාදන ඇතුළත් කර වාර්ෂික තිරසර සංවර්ධන සැලැස්මක සකස් කර නොතිබුණි. | | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව දන්වා ඇතත් නගර සභාව විසින් 2022 වර්ෂයේ ද ඇතැම් වත්කම් ප්‍රකාශණනය කර නොතිබුණි. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ හා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය අනුව ලද උපදෙස් පරිදි 2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතන සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන සඳහා ප්‍රත්‍යාගණනය සිදු කර ගිණුම්ගත කළ බව දන්වා සිටින අතර, සභාව සතු අනිකුත් ස්ථාවර වත්කම් සඳහා ප්‍රත්‍යාගණනය සිදු කරමින් පවතින බව. | සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.99,962,393 ක පළාත් සභා ණය හිමි ශේෂය තුළ 2017 සිට 2020 වර්ෂයන්ට අදාළ රු.3,647,895 ශේෂයක් ද 2021 වර්ෂය සඳහා රු.7,239,864 ක ශේෂයක් ද ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණයහිමියන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු විමසා තහවුරු කර ගැනීමෙන් පසු නිරවුල් කර වර්ෂයේ අවසන් ගිණුම් 2023 සකස් කිරීමේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව 2023 වර්ෂයේ ගෙවීම් කොටසක් කර ඇති අතර තවදුරටත් අයවිය යුතු ශේෂය රු.10,887,759.30 ක් බව. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2015 සිට 2021 වර්ෂය දක්වා ටෙන්ඩර් ඇප තැන්පත් රු.769,900 ක් නිරවුල් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී එම මුදල ආදායම ගැනීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | කැස්බෑව බලප්‍රදේශයේ පාසැල් වල 02 වසර සිට 05 වසර දක්වා පාසල් දරුවන් වෙනුවෙන් අභ්‍යාස පොත් කට්ටලයක් බැගින් 2021 නිවාඩුවට පෙර ලබාදීම සඳහා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් ණය පදනම මත 2021 දෙසැම්බර් 29 දින ලබාගෙන තිබූ අතර එම මිලදී ගත් පොත් කට්ටල අතුරින් රු.111,029 ක් වටිනා පොත් කට්ටල 306 ක් බෙදා නොහැර ගබඩාවේ ගබඩා කර තිබුණි. | පොත් බෙදා හැරීම සඳහා ලබා දුන් අයදුම්පත් නැවත නොලැබීම නිසා ඒ සඳහා වෙන් කරන ලද පොත් කට්ටල 300 ක් හා අතපසු වීමක් වන අවස්ථාවන් හිදි බෙදා හැරීමට ලබාදී ඉන් ඉතිරි වූ පොත් කට්ටල 06 ක් තව දුරටත් ඉතිරිව පවතී. ලබා දීමට නොහැකි වූ පොත් ලබා දීම වර්ෂිකව සිදු කරන නිසා පසුගිය වර්ෂයේ ඉතිරි වන සියලු පොත් ලබන වර්ෂයේ පොත් ලබා දීම සඳහා ලබා ගනු ලබයි. විශේෂයෙන් මෙම වසරේ පොත්වල මිල අධික ලෙස ඉහල | ඉතිරිව තිබෙන පොත් බෙදා දීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | යාමත් සමඟ වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදන වලින් ලබා දිය හැකි පොත් ප්‍රමාණය අඩු නිසා පසුගිය වසරේ ඉතිරිව ඇති පොත් පාර්සල් **306** ක ප්‍රමාණය ද මෙම වර්ෂයේ පොත් ලබා දීම සඳහා භාවිතයට ගන්නා බව. | |
| (ඉ) | නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන රු.**37,753,674** ක ශේෂයක් ඇති සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමෙන් වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදු කර නොතිබුණි. | රට තුල පවතින ආර්ථික තත්ත්වය මත මිල ගණන් ඉහළ යාම හේතුවෙන් එම ගිණුමෙන් සිදු කිරීමට යෝජිත වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු අගය ඉහල යාම නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත පමණක් එකී ගිණුමෙන් මුදල් වියදම් කළ යුතු වීම හේතුවෙන් මෙම ගිණුමෙන් ගනුදෙනු සිදු නොවූ බව. | මෙම ගිණුමෙන් ව්‍යාපෘති කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2022** ජනවාරි **01** දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.**43,659,052** ක් වුවද එම ශේෂය තුළ නිලධාරින් **10** දෙනෙකුගෙන් වර්ෂ **2011** සිට **2018** දක්වා අයවිය යුතු රු.**550,849** ක ණය ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4** වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවට අයත් පුස්තකාල හා අනෙකුත් කාර්යාලයන්හී බඩු වට්ටෝරු හා ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලේඛන යාවත්කාලීන කළ යුතුය. |